සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026/Grade 13 Final Term Test - 2026

0579

කෘෂි විද්‍යාව II
Agricultural Science II

08 | S | II

කාලය / நேரம் / Time } පැය 3 යි
අමතර කියවීම් කාලය මි. 10 යි

නම / பெயர் / Name } ..................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..............................

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

වැදගත්:

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 09 කින් යුක්ත අතර
- A සහ B යන කොටස් දෙකකින් යුත්ත වේ.කොටස් දෙකට ම නියමිත කාලය පැය තුනයි.

**A කොටස - ව්‍යුහගත රචනා ( පිටු 2 -8)**

- සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න. ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතුය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

**B කොටස - රචනා (පිටු 9)**

- මෙම කොටස ප්‍රශ්න හයකින් සමන්විත වන අතර ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A හා B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස B කොටසට උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට බාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| දෙවනි පත්‍රය සඳහා | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
| A | 01 | |
| | 02 | |
| | 03 | |
| | 04 | |
| B | 05 | |
| | 06 | |
| | 07 | |
| | 08 | |
| | 09 | |
| | 10 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

අත්සන

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| අධීක්ෂණය කලේ | |

## A කොටස - ව්‍යුහගත රචනා

- **A කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. A. දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් නවීන වාණිජ කෘෂි කර්මාන්තය, අද ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් ස්ථානයක් හිමිකර ගෙන ඇත.

i. නවීන වාණිජ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට පෞද්ගලික අංශයෙන් හා රාජ්‍ය අංශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දෙක බැගින් ලියන්න.

පෞද්ගලික - 1........................................................................................................

2........................................................................................................

රාජ්‍ය - 1........................................................................................................

2........................................................................................................

B. උෂ්ණත්වය බෝග නිෂ්පාදනය කෙරෙහි බලපාන වැදගත් සාධකයකි.

i. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල උෂ්ණත්වයේ විවිධත්වයක් ඇතිවීමට හේතු දෙකක් ලියන්න.

1. ................................................ 2. ................................................

ii. උෂ්ණත්වය වැඩිවීමෙන් බෝග වර්ධනයට සිදුවන බලපෑම් දෙකක් සඳහන් කරන්න.

1........................................................................................................

2........................................................................................................

C. පසේ ඇති පිද්‍රාවකාශ තුළ හා පස් අංශු වටා තදින් බැඳී පවතින ජලය පාංශු ජලය ලෙස හඳුන්වයි.

i. භෞතික වර්ගීකරණයට අනුව පාංශු ජල ආකාර නම් කරන්න.

1. ................................................ 2. ................................................

3. ................................................

ii. පාංශු ජලය මැනීමේ ක්‍රමයක් වන ජිප්සම් කුට්ටි ක්‍රමයේ දුර්වලතාවයක් සඳහන් කරන්න.

........................................................................................................

iii. ජිප්සම් කුට්ටි ක්‍රමය භාවිතා කළ නොහැකි අවස්ථාවක, ක්ෂේත්‍රයේ දී භාවිතා කළ හැකි වෙනත් ක්‍රමයක් සඳහන් කරන්න.

........................................................................................................

iv. පාංශු ජලයේ වැදගත්කම් දෙකක් ලියන්න.

1. ........................................................................................................

2. ........................................................................................................

v. වගා ක්ෂේත්‍රයක පසේ පවතින තෙතමන ප්‍රතිශතය මැනීම සඳහා ලබාගත් පස් සාම්පලයක බර 180g ක් විය. එය උඳුනේ වියළු පසු බර 120 g ක් විය. මෙම පස් සාම්පලයේ තෙතමන ප්‍රතිශතය ගණනය කරන්න.

........................................................................................................

........................................................................................................

........................................................................................................

D. ශාකයක වර්ධක කොටස්වලින් ශාකයක් ප්‍රචාරණය කිරීම වර්ධක ප්‍රචාරණය ලෙස හඳුන්වයි.

i. පහත සඳහන් බෝග ප්‍රචාරණය කිරීම සඳහා යොදා ගන්නා ශාක ප්‍රචාරණ ව්‍යුහ සඳහන් කරන්න.

| <u>ශාකය</u> | | <u>ප්‍රචාරණ ව්‍යුහය</u> |
|---|---|---|
| a. කෙසෙල් | - | ................................ |
| b. ස්ට්‍රෝබෙරි | - | ................................ |
| c. බිගෝනියා | - | ................................ |
| d. ඉන්නල | - | ................................ |
| e. මඤ්ඤොක්කා | - | ................................ |
| f. ගෝනි ගස් | - | ................................ |

ii. වර්ධක ප්‍රචාරණයේ ප්‍රධාන වාසි දෙකක් සඳහන් කරන්න.

1.. ........................................................................................................

2. ........................................................................................................



CamScanner

iii. දඩු කැබලි මගින් ශාක ප්‍රචාරණයේදී දඩු කැබැල්ලේ මුල් ඇදීම කෙරෙහි බලපාන අභ්‍යන්තර සාධක දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

E. කාබනික පොහොර ශාක හෝ සත්ත්ව කොටස් ආශ්‍රිතව ජනනය වේ.

i. කාබනික පොහොර වර්ග තුනක් ලියන්න.

1. .......................................................... 2. ..........................................................

3. ..........................................................

ii. කාබනික පොහොර භාවිතයේ වාසි දෙකක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

F. ආහාර නරක්වීම කෘත්‍රිමව පාලනය කරමින් ආහාරයේ ගුණාත්මක බව ආරක්ෂා කරමින් ආහාර කල්තබා ගැනීමේ ක්‍රියාවලිය ආහාර පරිරක්ෂණය ලෙස හඳුන්වයි.

i. ආහාර පරිරක්ෂණයේ ප්‍රධාන මූලධර්ම දෙක සඳහන් කරන්න.

1. .......................................................... 2. ..........................................................

ii. පහත සඳහන් ආහාර පරිරක්ෂණ ක්‍රම වලදී සිදුවිය හැකි පරිරක්ෂණ ක්‍රියාවක් බැගින් සඳහන් කරන්න.

1. ජීවාණුහරණය - ..........................................................................................

2. පැසවීම - ..........................................................................................

3. සාන්ද්‍රීකරණය - ..........................................................................................

02. A. බෝග වගාවේ ශාකවල වර්ධනය නිරීක්ෂණය කිරීම සඳහා වර්ධන පරාමිති වැදගත් වේ.

i. වර්ධන පරාමිති දෙකක් සඳහන් කරන්න.

1. .......................................................... 2. ..........................................................

ii. ශාකයේ වර්ධන වක්‍රය ඇඳ දක්වන්න.

iii. බෝගයක වර්ධන දර්ශකයක් වන පත්‍ර ක්ෂේත්‍රඵලය දර්ශකය (LAI) ගණනය කිරීමට භාවිතා කරන සමීකරණය සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

iv. පත්‍ර ක්ෂේත්‍රඵලය මැනීමට යොදාගන්නා ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1. .......................................................... 2. ..........................................................

B. රෝපණ ද්‍රව්‍ය සිටුවා ස්ථිර භූමියේ වගා කරන තෙක් ආරක්ෂිතව රැක බලා ගන්නා ස්ථානය තවානක් ලෙස හඳුන්වයි. පහත දැක්වෙන්නේ එවැනි විශේෂිත තවානක රූප සටහනකි.



i. මෙම විශේෂිත තවාන හඳුන්වන්න.

..........................................................................................................

ii. මෙහි තවාන් මිශ්‍රණය සකසා ගන්නා ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................



CamScanner

iii. මෙම තවාන් වර්ගය විශේෂයෙන් භාවිතා කරන බෝග වර්ග දෙකක් සඳහන් කරන්න.

1.......................................................... 2. ..........................................................

iv. මෙම තවානෙහි ඇති විශේෂිත වාසියක් සඳහන් කරන්න.

..................................................................................................................................

v. පහත සඳහන් අවස්ථා සඳහා පැළ ලබා ගැනීමේදී භාවිතා කරන විශේෂිත තවාන් වර්ග සඳහන් කරන්න.

a. බද්ධ කිරීමේදී ග්‍රාහක පැළ ලබා ගැනීම. - ..................................................

b. ජල රෝපිත වගාවන් සඳහා පැළ ලබා ගැනීම. - ..................................................

C. අතීතයේදී මස් පරිරක්ෂණය කිරීම සඳහා යොදාගත් දුම් ගැසීම මගින් ආහාරය පරිරක්ෂණය වන ආකාරය සඳහන් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

ආහාර පරිරක්ෂණය කිරීමට පෙර සිදුකරන ක්‍රියාවලියක් ලෙස බලාත්වීකරණය හෙවත් සුබ්‍රීකරණය හැඳින්විය හැක.

i. සුබ්‍රීකරණයේ මූලධර්ම දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

ii. සුබ්‍රීකරණය සිදුකරන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1.. ..........................................................................................................................

2. ..........................................................................................................................

iii. ඒකාබද්ධ ආහාර පරිරක්ෂණය යනු කුමක්දැයි හඳුන්වන්න.

..................................................................................................................................

D. යෙදවුම් කිහිපයක් යොදවන නිෂ්පාදන ක්‍රියාවලියක එක් යෙදවුමක් පමණක් වැඩි කරමින් අනෙක් යෙදවුම් සියල්ල නියතව තබා ගනිමින් මුළු නිෂ්පාදනය අතර සම්බන්ධතාවය පහත වගුවේ දක්වා ඇත. එම වගුව සම්පූර්ණ කරන්න.

(භූමිය ස්ථාවර සාධකය වන අතර වගා බිමට යොදා ගන්නා ශ්‍රමිකයන් ගණන විචල්‍ය සාධකය වේ.)

| භූමි ප්‍රමාණය හෙක් | ශ්‍රමිකයන් ගණන | මුළු නිෂ්පාදනය | සාමාන්‍ය නිෂ්පාදනය | ආන්තික නිෂ්පාදනය |
|---|---|---|---|---|
| 10 | 1 | 15 | | |
| 10 | 2 | 35 | | |
| 10 | 3 | 60 | | |
| 10 | 4 | 90 | | |
| 10 | 5 | 120 | | |
| 10 | 6 | 144 | | |
| 10 | 7 | 158 | | |
| 10 | 8 | 190 | | |
| 10 | 9 | 153 | | |
| 10 | 10 | 145 | | |

i. සාමාන්‍ය නිෂ්පාදනය හා ආන්තික නිෂ්පාදනය සොයන්න.

ii. මුළු නිෂ්පාදනය වැඩි වී ඉන්පසුව ක්‍රමයෙන් පහළ බැසීමට හේතුව සඳහන් කරන්න.

..................................................................................................................................

iii. යෙදවුම් නිමැවුම් සම්බන්ධතාවයට අනුව ප්‍රශස්ථ යෙදවුම් අවස්ථාව සෙවීම සඳහා යොදා ගන්නා මූලධර්මය සඳහන් කරන්න.

..................................................................................................................................



CamScanner

E. i. දේශගුණික විපර්යාස ඇතිවීමට කෘෂිකාර්මික කටයුතු ද බලපානු ලැබේ. එවැනි ක්‍රියාමාර්ග තුනක් සදහන් කරන්න.

1. ........................................ 2. ........................................

3. ........................................

F. බෝග වගාවේ දී පරිසර තත්ත්ව පාලනයට විවිධ උපක්‍රම භාවිතා කරයි.

i. තාවකාලික ප්‍රචාරක ව්‍යුහ හඳුන්වන්න.

........................................................................................

ii. a. තාවකාලික ප්‍රචාරක ව්‍යුහ හතරක් නම් කරන්න.

1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

b. මෙම ප්‍රචාරක ව්‍යුහ තුල බෝග සදහා හිතකර ලෙස පවත්වා ගත යුතු පරිසර තත්ත්වය සදහන් කරන්න.

........................................................................................

03. A. සාර්ථක බෝග වගාවක් සදහා ජල සම්පාදන කාර්යක්ෂමතාව පිළිබද සැළකිලිමත් වීම ඉතා වැදගත් වේ. මැටිමය පසක් ඇති වගා භූමියක පස ක්ෂේත්‍ර ධාරිතාවේ ඇති විට තෙතමන ප්‍රතිශතය 28 % වන අතර ස්ථිර මැළවීමේ අගය 14 % වේ. මූල මණ්ඩල ගැඹුර 1 m හා දෘශ්‍ය ඝනත්වය 1.2 $gcm^{-3}$ වේ. ජල සම්පාදන කාර්යක්ෂමතාව 70% වේ.

i. ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව ගණනය කරන්න.

........................................................................................

........................................................................................

........................................................................................

ii. දළ ජල සම්පාදන අවශ්‍යතාව ගණනය කරන්න.

........................................................................................

........................................................................................

........................................................................................

iii. මෙම ක්ෂේත්‍රයේ වාෂ්පීකරණ උත්ස්වේදනය දිනකට 7cm නම් ජල සම්පාදන කාලාන්තරය ගණනය කරන්න.

........................................................................................

........................................................................................

........................................................................................

........................................................................................

iv. ජල සම්පාදන කලාන්තරය තීරණය කිරීමට යොදා ගත හැකි සරල ක්‍රම දෙකක් සදහන් කරන්න.

1. ........................................................................................

2. ........................................................................................

v. ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ දැමීම සදහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සදහන් කරන්න.

1. ........................................................................................

2. ........................................................................................

3. ........................................................................................

B. ශ්‍රී ලංකාවේ වගා බිම්වලින් ලැබෙන අස්වනු වලින් 40 % ක් පමණ හානි වන්නේ ක්‍රමවත් අස්වනු කළමණාකරනයක් නොමැති වීමෙනි.

i. ආහාර පිසීමේ අවස්ථාවේ සිට පරිභෝජනය කරන අවස්ථාව දක්වා කාලයේදී ආහාරයට සිදුවිය හැකි හානි දෙකක් ලියන්න.

1. ........................................................................................

2. ........................................................................................

ii. පසු අස්වනු හානි නිසා ඇතිවන ගැටළු දෙකක් ලියන්න.

1. ........................................................................................

2. ........................................................................................

C. පටක රෝපණ අතරින් ක්ෂුද්‍ර ප්‍රචාරණය ශ්‍රී ලංකාවේ බහුලව භාවිතා වන ක්‍රමයකි.

i. ක්ෂුද්‍ර ප්‍රචාරණය යනු කුමක්ද?

..........................................................................................................................

..........................................................................................................................

ii. ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රියාවලියේ පියවර පිළිවෙලින් සඳහන් කරන්න.

1. ......................................................................................................................

2. ......................................................................................................................

3. ......................................................................................................................

4. ......................................................................................................................

5. ......................................................................................................................

iii. ක්ෂුද්‍ර ප්‍රචාරණයේ සීමාකාරිකම් දෙකක් සඳහන් කරන්න.

1. ......................................................................................................................

2. ......................................................................................................................

D. යම් සාධකයක් නිසා මුළු ශාකයම හෝ කොටසක් සාමාන්‍ය තත්ත්වයෙන් බැහැරව සිදු වන අපගමනයක් ශාක රෝගයක් ලෙස සලකයි.

i. ශාක රෝග හට ගැනීමට බලපාන ප්‍රධාන සාධක රෝග ත්‍රිකෝණය ඇසුරෙන් දක්වන්න.

ii. ශාක රෝග හට ගැනීමට බලපාන අජෛව සාධක දෙකක් සඳහන් කරන්න.

1. ......................................................................................................................

2. ......................................................................................................................

iii. ආසාදිත රෝග කොටසක් නිරීක්ෂණය කිරීමෙන් ශාක රෝග හඳුනා ගත හැකි අතර වෛරස රෝග හඳුනා ගැනීමට භාවිතා කරන නව තාක්ෂණික ක්‍රමවේද දෙකක් හඳුන්වන්න.

1. ................................................ 2. ................................................

iv. පහත ප්‍රකාශ හරි නම් ( √ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද යොදන්න.

a. කෘමි පළිබෝධ ගෝත්‍ර අතරින් ඕතොප්ටෙරා, හෙමිප්ටෙරා හා හෝමොප්ටෙරා යන ගෝත්‍ර සියල්ල අසම්පූර්ණ රූපාන්තරණය පෙන්වයි. ( ......)

b. මයිටාවන්ට, කෘමීන්ට මෙන්ම බාහිර සැකිල්ලක් ඇති අතර ශරීරය කොටස් තුනකට බෙදී ඇත. ( ..... )

c. ඇටෝරා යන වල් පැළෑටිය ආහාරයට ගැනීම නිසා දෙනුන්ගේ කිරිවල වර්ණයට බලපෑම් ඇති කරයි. ( ..... )

d. පොල්වල මුල් කුණු වීමේ ( Weligama root wilt disease ) රෝගයට හේතු කාරක පළිබෝධකයා වනුයේ නෙමටෝඩාවකි. ( ..... )

E. හිතකර දේශගුණික තත්ත්ව යටතේ ගොවිපොළ සතුන්ගේ උසස් නිෂ්පාදනයක් ලබාගත හැකිය.

i. පරිසර උෂ්ණත්වය ඉහළ යාම ගවයන් සඳහා බලපාන ආකාර දෙකක් ලියන්න.

1. ................................................ 2. ................................................

ii. අධික වර්ෂාපතනය ගොවිපොළ සත්ත්ව නිෂ්පාදනයට බලපාන ආකාරයක් සඳහන් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................



AL අපි

CamScanner

iii. අහිතකර දේශගුණික තත්ත්වල බලපෑම් අවම කරමින් සත්ත්ව නිෂ්පාදන ඉහළ නැංවීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

04. A. එළදෙනකගේ ක්ෂීරණ පද්ධතියේ ව්‍යුහයක රූපසටහනක් පහත දැක්වේ.




i. ක්ෂීරණ පද්ධතිය කුමන ග්‍රන්ථියක් විකරණය වීමක්ද?

..............................................................................................................

ii. a සිට g දක්වා කොටස් නම් කරන්න.

a – .............................. b – .............................. c – ..............................
d – .............................. e – .............................. f – ..............................
g – ..............................

iii. a. මෙම පද්ධතියේ මූලිකම ක්‍රියාකාරී ඒකකය කුමක්ද?

..............................................................................................................

b. එම ක්‍රියාකාරී ඒකකය කිරි ස්‍රාවය කෙරෙහි හැඩගැසී ඇත්තේ කෙසේද?

..............................................................................................................

..............................................................................................................

iv. ක්ෂීරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය කෙරෙහි පහත හෝර්මෝන වල බලපෑම සඳහන් කරන්න.

a. ..............................................................................................................

b. ..............................................................................................................

c. ..............................................................................................................

B. i. ක්ෂීර ග්‍රන්ථිය ආශ්‍රිතව සතුන්ට වැළඳෙන රෝගයක් නම් කරන්න.

..............................................................................................................

ii. එම රෝගයේ රෝග කාරකයා නම් කරන්න.

..............................................................................................................

iii. එම රෝගය වැළඳී ඇති දෙනකගේ බුරුල්ලේ පෙන්වන රෝග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

C. වගා ක්ෂේත්‍රයක සිටින පළිබෝධකයින් නියමිත ලෙස කළමණාකරණය කිරීමෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට හේතු වේ.

i. සාර්ථක පළිබෝධ පාලන වැඩසටහනක් සැලසුම් කිරීමේදී අනුගමනය කළ යුතු පළමු පියවර සඳහන් කරන්න.

..............................................................................................................

ii. පළිබෝධ පාලනයට වැයවන පිරිවැය හා පළිබෝධ හානිය නිසා අහිමිවන ආදායම සමාන පළිබෝධ ගහන ඝනත්වයට අදාල වන කල්පිත ප්‍රස්ථාරයේ සමතුලිත ලක්ෂ්‍ය නම් කරන්න.

..........

iii. පෙර අස්වනු කාලය යනු කුමක්ද?

..........

..........

iv. පළිබෝධ නාශකයක් යෙදීමේදී එහි ඇති පෘෂ්ඨීක සක්‍රියකාරකවල ( Surfactant) වල කාර්යය සඳහන් කරන්න.

..........

D. වෙනත් ජීවියෙකු යොදා ගෙන පළිබෝධ කළමණාකරණය ජෛව විද්‍යාත්මක පළිබෝධ කළමණාකරණයයි.

i. ජෛව පාලන කාරකයින් ලෙස යොදා ගන්නා ජීවී කාණ්ඩ දෙකක් සඳහන් කරන්න.

1. .......... 2. ..........

ii. ජෛව කාරකයින් තේරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

iii. හෝර්මෝන මගින් කෘමි පළිබෝධ කළමණාකරණයෙන් පාලනය වන කායික ක්‍රියාවන් දෙකක් සඳහන් කරන්න.

i. ..........

ii. ..........

iv. පළිබෝධ නාශක මර්ධනය කරනු ලබන පළිබෝධ කාණ්ඩ අනුව වර්ග කර දක්වන්න.

1. .......... 2. .......... 3. ..........

v. කෘමි නාශකවල ධූලකතාව ($LD_{50}$ ) යනු කුමක්ද?

..........

..........

E. ශාක අභිජනන ක්‍රියාවලියේදී ස්වභාවිකව ඇතිවන විකෘති මෙන්ම කෘත්‍රිමව විකෘති ඇති කර වඩාත් උචිත ශාක තෝරා ගනියි.

i. විකෘතියක් යනු කුමක්ද?

..........

ii. විකෘති අභිජනනය හඳුන්වන්න.

..........

iii. විකෘති අභිජනනය සිදුකරන ආකාර දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

iv. ශාකවල විකෘති ඇතිකිරීමට යොදාගන්නා විකෘති කාරක දෙකක් නම් කරන්න.

1. .......... 2. ..........



CamScanner

**B කොටස - රචනා**

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුර සපයන්න.**

05. i. පාංශු පුනරුත්ථාපනය සඳහා කෘෂිකාර්මික කටයුතු සිදු කරන අවස්ථාවේ දී අනුගමනය කළ හැකි නිවැරදි පිළිවෙත් විස්තර කරන්න.

ii. කාබනික කෘෂිකර්මාන්තයේ ලක්ෂණ විස්තර කරන්න.

iii. පසු අස්වනු තාක්ෂණයේ දී කල්තබා ගැනීම අනුව බෝග අස්වනු වර්ගීකරණය කර, ඒවා අතර වෙනස්කම් විස්තර කරන්න.

06. i. ශාක අතු බැඳීමේ විවිධ ක්‍රම විස්තර කරන්න.

ii. ජාන සම්පත් සංරක්ෂණය හඳුන්වන්න. ජාන සම්පත් විනාශ වීමට බලපෑම් කරන මිනිස් ක්‍රියාකාරකම් විස්තර කරන්න.

iii. වී වගාවේ දී ඩැපොග් තවානක් පිළියෙල කර ගන්නා ආකාරය විස්තර කරන්න.

07. i. නිවැරදිව හා ක්‍රමවත්ව වසු පැටවුන් පාලනයේ වැදගත්කම විස්තර කරන්න.

ii. අධික සුළඟ මඟින් බෝග වගාවට ඇතිවන අහිතකර බලපෑම් විස්තර කරන්න.

iii. බහු වාර්ෂික වල් පැළෑටි සාර්ථකව පාලනය කල හැකි ක්‍රම විස්තර කරන්න.

08. i. බෝග ක්ෂේත්‍රවල ජල වහනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ පැහැදිලි කරන්න.

ii. කෘෂි ව්‍යාපාර සඳහා ව්‍යාපාර සැලැස්මක් සැකසීමේ වැදගත්කම සඳහන් කරන්න.

iii. ඉහළ ගුණාත්මයෙන් යුත් රෝපණ ද්‍රව්‍ය භාවිතයේ වැදගත්කම විස්තර කරන්න.

09. i. සංසරණය නොවන ද්‍රව මාධ්‍ය තුල නිර්පාංශු වගාව සිදු කිරීම සඳහා මුල් ගිල් වූ වගාව සිදු කරන අයුරු කෙටියෙන් විස්තර කරන්න.

ii. ගොවිපොළ සතුන්ගේ රෝග වළක්වා ගැනීමට ගත යුතු උපක්‍රම පැහැදිලි කරන්න.

iii. පාංශු පෝෂක පසෙන් ඉවත්වන ආකාර විස්තර කරන්න.

10. i. ආහාර ලේබල් කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. බෝග වර්ධනයේ දී ඔක්සිනවල වැදගත්කම පැහැදිලි කරන්න.

iii. බෝග නිෂ්පාදනයේ දී පාංශු පැතිකඩ පිළිබඳ දැනුමක් තිබීමේ වැදගත්කම විස්තර කරන්න.



CamScanner